# සෙතුම්ගේ කවි සිතුවිලි



සෙතුම් ලෝමෙත් ඒකනායක




| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2023-11-11 |
| පොතේ නම | : | සෙතුම්ගේ කවි සිතුවිලි |
| කර්තෘ | : | සෙතුම් ලෝමෙත් ඒකනායක |
| පාසල | : | කිංස්වුඩ් විද්‍යාලය මහනුවර |
| ISBN අංකය | : | 978-624-206-831-2 |

මුද්‍රණය
“PRESS”
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

පුංචි ම පුංචි රස හීන දකින,
පුංචි පුතෙක් වූ මට...
පණ මෙන් ආදරය කරන,
හරි ම හරි දේ හරියට කියාදෙන,
මගේ ආදරණීය අම්මා ට...
හදවතේ ගැඹුරු ම තැනින්
මට සෙනෙහස දෙන
මගේ ආදරණීය අප්පච්චී ට...
දඟකාර සිසුවෙකු වූ මගේ
දඟ වැඩ ඉවසන
ආදරණීය අනුෂා මැඩම් ට...
මගේ ආදර ඉස්කෝලේ
කිංස්වුඩ් විදුහල් මෑණියන් ට...
මගේ ආදර ලොකු අත්තා ට...
දිව්‍ය ලෝකයේ ගොස් සිටින
අත්තම්මලා දෙදෙනාට, ලොකු සීයාට...
සෙතුම්ගේ කවි සිතුවිලි
ආදරයෙන් පුදමි...

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# ස්තූතිය

වෙන කාටවත් නැති තරම් හොඳ දේ දෙන
මගේ අම්මා ට ... අප්පච්චීට ...
මගේ පන්තිය (2R) භාර අනූෂා බෝගහපිටිය ගුරුතුමිය ට ...
මගේ පන්තියේ (2R) ආදරණීය, මං වගේ ම දඟම දඟ යාළුවන් ට ...
මට සතුට දෙන කිංස්වුඩ් විදුහල් මාතාව ට ...
චිත්‍ර අඳින්නට, කවි ලියන්නට බැරියෝ ම කියා සිටිය දී,
''මල්ලීට පුළුවන් '' යැයි කියමින්
මා දිරිමත් කළ
අම්මාගේ මහාමායා බාලිකාවේ
4B පන්තියේ ආදරණීය අක්කිලා ට ...
සතුන්ගේ චිත්‍ර අඳින්නට බැරි ම යැයි කියද්දී
ලියූ කවි වලට චිත්‍ර 3 ක් ඇඳ දුන්
නදේ, නතායා, සෙයාරා, සෙනුජි අක්කිලා ට ...
ISBN අංකය රැගෙන දුන් සතිනි අක්කිගේ අම්මිට ...
මහාචාර්ය පූටන් වන් වන්න සෙතුම් කියමින්
KCC පොත් ප්‍රදර්ශනයේ හමු වූ දින පොතක් ලියන්නට මා දිරිමත් කළ
ළමයින්ට පොත් ලියන නුවන් තොටවත්ත මාමාට
ස්තූතිවන්ත නොකරම බැරි ය.

*පෙර පාසල් කාලයේ සිට ම මා විසින් ඇඳ තිබූ කුරුටු චිත්‍ර ප්‍රවේශමෙන් බලාගෙන, විටින් විට මා මිමිණූ කවි පද මටත් හොරා ම එකතු කර හැදූ කවි පොත මගේ පළමු පොත,*

*ගොඩාක් ලොකු වුණු කාලෙක මට බලන්නට අවස්ථාව සැලසූ පොත් සර් සෙනෙවිරත්න ගුරුතුමාටත් ස්තූතියි.*

# නැවක් ඇදෙනවා

රැල්ල නැගෙනවා
වෙරළෙ හැපෙනවා
නිල් පාටට වතුර ගොඩක්
ඈත පෙනෙනවා

වලාකුළේ ගෑවෙන්නට
කොඩි ලෙලදෙනවා
කිරි මුහුදේ හුඟක් ඈත
නැවක් ඇදෙනවා ...



# මගේ ගෙදර

ඉර පායා එළිය දෙයි
මල් පිපිලා ලස්සනයි
වලාකුළේ ගෑවෙන්නට
යන්න මට හිතයි

පාට පාට මලින් පිරුණු
තණකොළ යායෙන් හැඩවුණු
මගේ ගෙදර සිරියාවෙන්
ගම ම ලස්සනයි ...



# බිම්මල් ගෙදර
# (යෝධයාට නින්ද ගිහින්)

හරි ලස්සන පාට පාට
බිම්මල් ගෙදරක අයිනෙන්
හිනැහීලා පොඩි ළමයෙක්
හැංගී ඉන්නේ

යෝධයාට නින්ද ගිහින්
මහ සද්දෙට ගොරවද්දී
බයක් නැද්ද දැන් ඔයාට
හිනැහී ඉන්නේ

හෙමි හෙමිහිට අඩි තිය තිය
ජනේලයෙන් පැනලා විත්
පාර දිගේ ගම්මානෙට
පැනලා යන්නේ ...



# මූලක ගුණ

එළවළු පැළ
පොළොව උඩින්
මුල් ඔක්කොම
පොළොව යටින්

හැම පැළය ම
මුල් හින්ද යි
නොවැටී ඉන්නේ ...




# පෙරහැර එනවා

ඩෙංකුටු ඩෙංකුටු
ඩෙංකුටු ඩෙංකුටු
නුවරට පෙරහැර
එනවා ලස්සන

කරඬුව ගෙන යන
ඇත් රජු ලස්සන
හේවිසි හොරණෑ
තාලෙට නටමින්

සාදුකාර හඬ
පැතිරී යනකොට
ආසයි බලන්න
නුවර ම ලස්සන ...



# උදෑසන

ඉර මාමා
කඳු අතරින්
එබී බලන
උදෑසනේ

නිල් තණකොළ
එළිය වැටී
පිබිදී එන
උදෑසනේ

දිය ඇල්ලක්
නිල් පාටට
ගලා හැලෙන
උදෑසනේ

සීත වුණත්
පැන නාන්න
ආසයි මට
උදෑසනේ ...



# හොඳ ළමයා මං තමයි

අම්මගෙ පණ
මං තමයි
තාත්තගෙ පණ
මං තමයි

අම්මා තාත්තට
කීකරු
හොඳ ළමයා
මං තමයි

අම්මා මට ආදරෙයි
තාත්තා මට ආදරෙයි
මගේ සතුටු පුංචි ලොවට
හැමදාමත් ආදරෙයි...



# සිහින වාහනේ

හරි ම දිගයි
දිගට දිගේ
හරි ම උසයි
උසට උසේ

කොළ පාටයි
කහ පාටයි
මගෙ ආස ම
පාට එක්ක

ලොකු වුණා ම
මම ම හදන
සිහින
වාහනේ ...



# නුවර ලස්සනයි

ඇත් රජුනේ
ආඩම්බර
හරි ම හැඩට
පා තිය තිය

කරඬුව පිට උඩ
යනෙනා
ගමන අපූරුයි


සාධුකාර හඬ
ඇසෙනා
නුවර ලස්සනයි



# හා හා හරි සුදු හාවා

හා හා හරි
සුදු හාවා
කැලේ පුරා
දුව පැන්නා

හිනා කටයි
දත් පෙන්වා
කැරට් අලය
කා දැම්මා



# සමනලයා

හරි ලස්සන
පාට පාට
අත්තටු ඇති
සමනලයෝ

මලට වසා
පැණි බීලා
යනවද පොඩි
සමනලයෝ




# දළඹු පැංචා

දළඹු පැංචෝ
දළඹු පැංචෝ
කොහේද යන්නේ ?

කලබලයෙන්
කෑම සොයා
ගෙන දෝ යන්නේ ?

අන්න අතන
කොළ ගොල්ලේ
කෑම තියෙන්නේ

කෑම කාලා
බඩ පුරවා
සතුටින් යන්නේ



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුර අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01